**මතුගම ප්‍රාදේශීය සභාව**

**------------------------------**

**කළුතර දිස්ත්‍රික්කය**

**------------------**

1. මූල්‍ය ප්‍රකාශන

-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

--------------------------------

2019 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2020 මාර්තු 13 දින විගණනයට ඉදිරිපත් කර තිබුණු අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබද විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2020 අගෝස්තු 13 දිනද විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 සැප්තැම්බර් 30 දින ද සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට මතුගම ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

-------------------------------------------

(අ) ගිණුම්කරණ අඩුපාඩු

-------------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | --------------------- |
| (i) | 2019 දෙසැම්බර් 31 දිනට ස්ථාවර තැන්පත් ගිණුමේ ශේෂය රු.132,093 ක් වැඩියෙන් පෙන්වා තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කල යුතුය. | ඉදිරි ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (ii) | සමාලෝචිත වර්ෂය දක්වා මිලදී ගන්නා ලද ඉන්වෙන්ට්‍රි භාණ්ඩ වල පිරිවැය රු.3,816,102 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත්හැරී තිබුණි. | මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතුය. | 2020 වර්ෂයේදී නිවැරදි කරන බව දන්වමි. |
| (iii) | මතුගම, පොදු වෙළඳපොල ඉඩම රු.5,000,000 ක් ලෙස ස්ථාවර වත්කම් ලේඛනයේ දක්වා තිබුණ ද , මූල්‍ය ප්‍රකාශනවල රු.16,000,000 ක් ලෙස පෙන්වා තිබීම නිසා රු.11,000,000 කින් වැඩියෙන් දක්වා තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

| | | | |
|---|---|---|---|
| (iv) | 2019 දෙසැම්බර් 31 දිනට ප්‍රාග්ධනයට ආධාර මගින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.113,236,425 ක් වුවත්, මූල්‍ය ප්‍රකාශනවල රු.113,045,149 වශයෙන් දැක්වීම හේතුවෙන් රු.191,276 ක් අඩුවෙන් පෙන්වා තිබුණි. | නිවැරදි ශේෂය ගිණුම්ගත කල යුතුය. | ඉදිරි ගිණුමෙන් නිවැරදි කරන බව දන්වමි. |
| (v) | සමාලෝචිත වර්ෂයේදී මතුගම ළමා උද්‍යානය නවීකරණය කිරීම සඳහා දරන ලද රු.2,273,550 ක් හා ඉඩම් දෙකක වටිනාකම වූ රු.1,305,000 ක මුදල මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සියළු වත්කම් ගිණුම්ගත කල යුතු බව | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |
| (vi) | සමාලෝචිත වර්ෂය තුල ගබඩා ලෙජරයේ පැවති රු.298,770 ක් වටිනා තොග අයිතම 15 ක් මූල්‍ය ප්‍රකාශනවලට ගෙන නොතිබුණි. | සියළු තොග වටිනාකම් ගිණුම්ගත කල යුතු බව | ඉහත තොග අයිතමයන් ගිණුම්ගත කල බව දන්වමි. |
| (vii) | තොග වටිනාකම ලෙස භෞතික තොගය ගිණුම්ගත කිරීම වෙනුවට රු.3,726,886 ක් වූ පොත් අගය ගිණුම්ගත කර තිබුණි. | තොග සමීක්ෂණයක් කර පොත් අගය තහවුරු කළ යුතුය. | ඉදිරියේදී සමීක්ෂණ වාර්තාවක් ඉදිරිපත් කරමි. |

(ආ) නොසැසඳුණු ගිණුම්

----------------------

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| | ---------------------- | ------------ | ---------------------- |
| (i) | මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන රු.62,910,888 ක් වූ ගිණුම් විෂයන් 07 කට අදාළ ශේෂයන් හා ඒවාට අදාළ උපලේඛනවල දැක්වෙන ශේෂයන් අතර රු. 1,067,708 ක වෙනසක් නිරීක්ෂණය විය. | මූල්‍ය ප්‍රකාශන හා උපලේඛන සැසඳීම් කර වෙනස ගැලපීම් කළ යුතුය. | අදහස් දක්වා නොමැත. |
| (ii) | සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධනයට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය මූල්‍ය ප්‍රකාශන අනුව රු.361,879,185 ක් වුවද, ලෙජර් ගිණුම අනුව රු.359,128,059 ක් විය. | නිවැරදි ශේෂය ගිණුම්ගත කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) ලැබිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| (i) වසර ගණනාවක සිට අයවීමට තිබූ රු.358,225 ක් වූ විපී ආලෝක ආධාර ශේෂයක් හා රු.96,000 ක් වූ පෞද්ගලික බස් නැවතුම්පල ගාස්තු ශේෂයක් විය. | අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කල යුතුය. | අයවිය යුතු ශේෂයන් අයකර ගැනීමට හා කපා හැරීමට කටයුතු කරන බව දන්වමි. |
| (ii) 2015 වර්ෂයට පෙර සිට පැවත එන රු.751,929 ක් වූ කර්මාන්ත තැන්පතු ශේෂය නිරවුල් කිරීමට හෝ ආදායමට ගැනීමට කටයුතු කර නොතිබුණි. | නිරවුල් කිරිමට හෝ ආදායමට ගැනීමට කටයුතු කල යුතුය. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව දන්වමි. |

(ඇ) විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැතිවීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය , තැන්පතු ලේඛනය හා තුලනය කරන ලද ලෙජර් ගිණුම් නොමැතිවීම නිසා එකතුව රු.124,969,002 ක් වූ ගිණුම් විෂයයන් 06 ක් විගණනයේදී සතුටුදායක ලෙස සංනිරීක්ෂණය කිරීමට නොහැකි විය. | ස්ථාවර වත්කම්, තැන්පතු ලේඛන මගින් වත්කම් ශේෂය තහවුරු කලයුතු අතර මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීමට ලෙජර් ගිණුම් තුලනය කළ යුතු බව අවධාරණය කරමි. | 2020 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කරන බව දන්වමි. |

1.4 අනුකූල නොවීම්

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූලනොවීම්

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- | --- |
| | රු. | | | |
| (අ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 21 වගන්තිය | | ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගත් මාර්ග 387 ක් මිනින්දෝරු සැලැස්මට | ග්‍රාම සේවා වසම් අනුව හඳුනාගෙන මිනින්දෝරු සැලැස්මට අනුව | සහා මාර්ග කිහිපයක් ගැසට් කර ඇති අතර තවත් |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | අනුව මිණුම් කර නොතිබුණි. | මිණුම් කල යුතුය. | මාර්ග ගැසට් කිරිම සඳහා විෂයභාර ඇමතිතුමාගේ අනුමැතියට යවා ඇති බව දන්වමි. |
| (ආ) | 2018 දෙසැම්බර් 14 දිනැති අංක 2012 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය | 257,600 | දැන්වීම් පුවරු 11 කින් ආදායම් ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | දැන්වීම් පුවරු ආදායම් සභාවට ලබා ගැනීමට කටයුතු කල යුතුය. | දැන්වීම් පුවරු ආදායම් ලබා ගැනීමට කටයුතු කරන බව දන්වමි. |

## 2. මූල්‍ය සමාලෝචනය

---------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.18,363,677 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.34,020,020 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

-------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්,බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | | 2019 | | | | 2018 | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල් කළ ආදායම | රැස් කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 15,001,942 | 15,778,047 | 10,664,042 | 5,114,005 | 14,776,500 | 14,554,045 | 12,180,632 | 2,373,413 |
| (ii) | කුලි | 15,174,300 | 7,299,475 | 6,597,131 | 702,344 | 8,944,800 | 10,076,431 | 9,520,911 | 555,520 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,698,500 | 535,180 | 524,180 | 11,000 | 332,000 | 468,628 | 468,628 | - |
| | | 31,874,742 | 23,612,702 | 17,785,353 | 5,827,349 | 24,053,300 | 25,099,104 | 22,170,171 | 2,928,933 |

2.2.2 ආදායම් රැස් කිරිමේ කාර්ය සාධනය

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) 2020 ජුනි 30 දිනට සභාවේ වරිපනම් බදු හිඟයෙන් වසර 05 කට වඩා පැරණි හිඟ රු.744,748 ක්ද, වසර 01 -05 අතර හිඟය රු.965,808 ක් ද විය. | හිඟ වරිපනම් ආදායම අයකර ගත යුතුය. | හිඟ වරිපනම් වාර්ථාව ඉදිරිපත් කර ඇති බව දන්වමි. |
| (ආ) හිඟ වරිපනම් නොගෙවීම සම්බන්ධයෙන් දේපල තහනම් කිරිමේ කටයුතු කර නොතිබුණි. | හිඟ වරිපනම් අයකර ගැනීමට දේපල තහනම් කල යුතුය. | හිඟ වරිපනම් අයකර ගැනීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වමි. |

2.2.3 උසාවි දඩ හා මුද්දර ගාස්තු

---

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරින්ගෙන් 2019 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.35,000,000 ක් හා උසාවි දඩ රු.3,300,000 ක් විය. | හිඟ ආදායම අයකර ගත යුතුය. | හිඟ ආදායම අයකර ගැනීමට කටයුතු කරමි. |

3 මෙහෙයුම් සමාලෝචනය

---

3.1 කාර්ය සාධනය

---

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගි සේවා, සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය , පහසුව හා සුභ සාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) අතුරු ව්‍යවස්ථා<br>------------------<br>ප්‍රාදේශිය සභා පනතේ 126 වන වගන්තිය යටතේ ප්‍රධාන කාරණා 16 ක් ඉටු කිරිම සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුව තිබු නමුත් 2019 දෙසැම්බර් 31 දින වන විටත් සභාව විසින් ප්‍රධාන කාරණා 03 ක් වෙනුවෙන් පමණක් අතුරු ව්‍යවස්ථා පනවා ගෙන තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා නොමැති කාරණා සඳහා අතුරු ව්‍යවස්ථා පැනවිය යුතුය. | සභා බල ප්‍රදේශයේ ක්‍රියාත්මක කල හැකි කාරණා 08 ක් වෙනුවෙන් අතුරු ව්‍යවස්ථා පනවා ඇති බව දන්වමි. |

(ආ) ක්‍රියාකාරි සැලැස්ම

---------------------

| | | |
|---|---|---|
| (i) ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල රාමුව හඳුනාගෙන නොතිබුණි. | ක්‍රියාකාරි සැලැස්ම තුල ව්‍යාපෘති හඳුනාගෙන ක්‍රියාත්මක කිරිමේදී කාල රාමුව හඳුනාගත යුතුය. | 2021 සැලසුම් සකස් කිරිමේදී අවශ්‍ය කටයුතු සිදු කරන බව දන්වමි. |
| (ii) සමාලෝචිත වර්ෂය තුල සභා කර්මාන්ත යටතේ රු.මි.11.85 ක මාර්ග 35 ක් ඉදිකර තිබුණ ද එය ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කර නොතිබුණි. | සභා කර්මාන්ත ක්‍රියාකාරි සැලැස්මට ඇතුලත් කළ යුතුය. | ක්‍රියාකාරි සැලැස්ම අනුව ඉදිරියේදි නිවැරදිව කටයුතු කරන බව දන්වමි. |

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

----------------------------

| | | |
|---|---|---|
| සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු 11 ක් ක්‍රියාත්මක කිරීම සඳහා 2019 වර්ෂය තුල වැඩසටහන් 13 ක් හඳුනාගෙන තිබුණ ද, සමාලෝචිත වර්ෂය තුල වැඩ සටහන් 06 ක් පමණක් ක්‍රියාත්මක කර තිබු අතර වැඩසටහන් 03 ක කාර්ය සාධන ප්‍රගතිය ඉදිරිපත් කර නොතිබීම හා වැඩසටහන් 02 ක ප්‍රගතිය ළඟා කර ගැනීමට සභාව අපොහොසත් වී තිබුණි. | තිරසර සංවර්ධන සැලැස්ම අනුව හඳුනාගත් ව්‍යාපෘති ඉටු කල යුතුය. | 2020 වර්ෂයේ සිට සැලසුම් සහගතව ප්‍රතිපාදන ඇතුලත් කර ක්‍රියාත්මක කරමි. |

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| කර්මාන්ත 14 ක කල් ඉකුත් වූ පරිසර බලපත්‍ර අළුත් කිරීමට කටයුතු කර නොතිබුණි. | පරිසර බලපත්‍ර කල් ඉකුත් වීමට පෙර නිකුත් කල යුතුය. | කර්මාන්ත කරුවන් කොටසක් බලපත්‍ර ලබා ඇති අතර කොවිඩ් ගැටළුව නිසා කොටසක් බලපත්‍ර ලබා ගැනීමට නොපැමිණි බව දන්වමි. |

3.3 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) සේවක පුරප්පාඩු හා අතිරික්ත | | |
| (i) තනතුරු 11 ක පුරප්පාඩු 19 ක් විය. තත්‍ය කාර්ය මණ්ඩලයට අතිරේකව ආදේශක හා තාවකාලික පදනමින් සේවකයින් 33 බඳවාගෙන තිබුණි. | තනතුරු සඳහා පුරප්පාඩු පුරවා ගැනීමට කටයුතු කළ යුතු අතර අතිරික්ත කාර්ය මණ්ඩලය සඳහා අනුමැතිය ලබාගත යුතුය. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු කරන බව හා බඳවා ගැනීමේ පටිපාටියට අනුව ආදේශක බඳවා ගැනීම් සිදු කර ඇති බව දන්වමි. |
| (ii)රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 25/2014 ප්‍රකාරව තනතුරු 06 කට අදාලව නිලධාරින් 41 ක් බඳවාගෙන තිබුණු අතර එකී නිලධාරින් අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ගැනීමට සමාලෝචිත වර්ෂය තුල කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. | මේ සඳහා අවශ්‍ය ලිපිගනුදෙනු බලධාරින් වෙත ඉදිරිපත් කර ඇති බව දන්වමි. |
| (ආ) සේවක ණය | | |
| සේවය හැරගිය නිලධාරින් තිදෙනෙකුගේ හා මියගිය නිලධාරින් දෙදෙනෙකුගෙන් අයවිය යුතු පිළිවෙලින් රු.219,525 ක් හා රු.69,900 ක ශේෂ වර්ෂයකට වඩා කාලයක සිට හිඟව පැවතුනි. | හිග ශේෂ අයකර ගැනීමට කටයුතු කල යුතුය. | ඉදිරියේදී අයකර ගැනීමට කටයුතු සිදු කරමින් පවතින බව දන්වමි. |

3.4 මෙහෙයුම් අකාර්යක්ෂමතා

------------------------------

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) ප්‍රාදේශිය සභා පනතේ විධිවිධාන වලට අනුව සභාව විසින් පෙර පාසැල් සේවය නොමිලේ සැපයිය යුතු වුවද , අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමකින් තොරව පෙර පාසැල් ළමයින් ඇතුලත් කිරිම වෙනුවෙන් 2018 හා 2019 වර්ෂ වල ඇතුළත්වීමේ ගාස්තු හා මාසික ගාස්තු වශයෙන් පිළිවෙලින් රු.866,500 ක් හා රු.506,300 ක් අයකර තිබුණි. | අතුරු ව්‍යවස්ථා පනවා ගැනීමක් නොමැතිව පෙර පාසැල් ගාස්තු අය නොකල යුතුය. | 2021 සිට නොමිලේ පෙර පාසැල් අධ්‍යාපනය ලබා දෙන බව |

| | | |
|---|---|---|
| (ආ) හොරණගොඩ පාර , ඕවිටිගල , මතුගම පිහිටි අගුරුවගොඩැල්ල ඉඩමේ සැලැස්ම කොන්දේසි වලට යටත්ව 2019 ජනවාරි 11 දින අනුමත කර තිබූ නමුත් එකී කොන්දේසි සම්පූර්ණ කර නොතිබියදි එම ඉඩමේ අනුබෙදුම් 24 ක සැලසුම් 2019 සැප්තැම්බර් 12 දින වන විටත් අනුමත කර තිබුණි. | සැලසුම් අනුමත කිරිමේදී සැලසුම් කොන්දේසි ඉටු කර තිබිය යුතුය. | සංවර්ධනය කර තිබූ බිම් කොටස් සඳහා පමණක් සැලසුම් අනුමත කර ඇති බව දන්වමි. |

3.5 ප්‍රසම්පාදනය
---------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල සටහනක් අනුව ප්‍රසම්පාදනයන් සිදු කර නොතිබුණි. | විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් හා කාල සටහනකට අනුව ප්‍රසම්පාදනය සිදු කල යුතුය. | ඉදිරියේදී ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කරන බව දන්වමි. |

3.6 කොන්ත්‍රාත් පරිපාලනය
--------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| තාර දමා මාර්ග සංවර්ධනය කිරිමේදී මාර්ගයේ පාදම සකස් කිරීම සඳහා මාර්ග තලනය භාවිතා කල පැය ගණන හා වාර ගණන පිළිබඳ තහවුරුවකින් තොරව ව්‍යාපෘති 05 ක ගල් අතුරා තැලීම වෙනුවෙන් රු.601,794 ක් කොන්ත්‍රාත් සමිති වෙත ගෙවා තිබුණි. | මාර්ග තලනයේ මීටරය අනුව කොපමණ පැය සංඛ්‍යාවක් භාවිතා කර තිබුණ ද යන්න තහවුරු කල යුතුය. | ගල් අතුරා තැලීමෙන් පසු තාර ඇතිරීම නිසා මාර්ග තලනය භාවිතා කරන දින හා වාර ගණන ගණනය කිරීමක් සිදු නොකරන බව දන්වමි. |

3.7 නොවිසඳි ඇති විගණන නිරීක්ෂණ
--------------------------------------

| විගණන නිරීක්ෂණය<br>---------------------- | නිර්දේශය<br>------------ | ගණන්දීමේ නිලධාරියාගේ අදහස් දැක්වීම<br>---------------------- |
|---|---|---|
| (අ) 2018 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 1.2.1 (ආ) , (ඈ) , (ඊ) සහ (ඕ) ඡේද නිවැරදි කර නොතිබුණි. | ගිණුම් කාරක සභා නියෝග ක්‍රියාත්මක කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |

| | | |
|---|---|---|
| (ආ) 2017 වර්ෂයේ විගණකාධිපති වාර්තාවේ 2.2.1( එ) හා (ඒ) ඡේද නිවැරදි කර නොතිබුණි. | පෙර වර්ෂයේ ගිණුම්කරණ අඩුපාඩු නිවැරදි කල යුතුය. | ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වමි. |